පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 19 දින සභාපති වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ප්‍රයෝනයට ගනු ලබන මොටර් වාහන 14 ක වටිනාකම රු. 9,143,000 ක් ලෙස තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් තිබුණද, එම වාහනවල අයිතිය මාරුකර නොතිබීමෙන් මොටර් වාහනවල වටිනාකම ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන අයිතිය පවරා නොගත් මෝටර් වාහන 07 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් වාහනවල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවේ නමට අයිතිය පවරාගෙන තිබූ වටිනාකම් තක්සේරුකළ වාහන 05 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මොටර් වාහනවල වටිනාකම් රු. 995,000 කින් ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉඩම් ගොඩනැගිලි 06 ක වටිනාකම් ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් ඉඩම් ගොඩනැගිලිවල වටිනාකම් රු. 2,126,064 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
-------------------

වර්ග 4 ක රු. 34,875 ක අත්තිකාරම් මුදල් අදාල වර්ෂයතුල පියවිය යුතබව දක්වා තිබුණද මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

අදාල පුද්ගලයින්ට හෝ ආයතනයන්ට ගෙවියයුතු වර්ග 72 ක ගනුදෙනු රු. 2,714,090 මෙතෙක් ගෙවීම් නොකර තැන්පත් ගිණුම්වල දක්වා තිබුණි.

1.3.4 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

------------------------------------------------

සභාව විසින් වාහන ලේඛනය,හානි හා පාඩු ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

අවශ්‍ය සාක්ෂි නොමැති වීම හේතුවෙන් රු. 13,866 ක් වටිනා ගනුදෙනුවක් විගණනයේදී සත්‍යාක්ෂනය කිරීමට නොහැකිවිය.

1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදයේ I රීති 5 (xii) | මුදල් හා ගබඩා භාර නිලධාරින්ගෙන් ඇප මුදල් ලබාගත්බව සනාථ කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මුදල් රෙගුලාසි 571 | රු. 2,719,033 ක වර්ෂ දෙකක් ඉක්මවූ රැඳවුම් මුදල මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර විවිධ තැන්පත් ගිණුමේ පෙන්වා තිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන පාරිභෝජනය පිළිබද පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 30,645,168 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 21,255,711 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,389,457 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 261,246 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 5,401,962 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 5,140,716 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණ.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 146,051,137 ක් වී තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 128,395,174 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 17,655,963 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපති විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත (2016) | තථ්‍ය (2016) | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 60 | 79 | 919 |
| බදු කුලී | 6,040 | 4,413 | 117 |
| බලපත්‍ර ගාස්තු | 1,170 | 1,264 | - |
| වෙනත් ආදායම් | 65,930 | 62,915 | - |
| එකතුව | 73,200 | 68,671 | 1,036 |

2.4.2 බදු

රු. 117,000 හිඟ බදු මුදල, අදාල වර්ෂයේ අයවිය යුතුව තිබුණි.

2.4.3 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශයේ ප්‍රදේශ 02 ක සන්නිවේදන කුළුණු 02 කින් බලපත්‍ර ගාස්තු සහ ඉදිකිරීම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.4.4 වෙනත් ආදායම්

සභා බල ප්‍රදේශයේ පිහිටි සුසාන භූමි 34 කින් සුසාන භූමි බදු සභාව විසින් අයකර නොතිබුණි.

2.4.5 මුද්දර ගාස්තු

---------------

2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 5,369,625 ක් අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 81 ක් වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 73 ක් විය. ඒ අනුව පුරප්පාඩු 12 ක් හා අතිරික්ත 04 ක් විය.

(ආ) සභාවේ ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාම සඳහා වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවත්විය යුතුය. එසේ වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රුැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයේදී ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් ලද රු. 145,113 ක් අදාල ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදී නොතිබුණි.

3.3 ඌන උපයෝජිත වත්කම්

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් පොළවල් 02 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) රු. 2,805,443 ක් වැයකර මුහුදු වෙරළ සංචාරක ප්‍රවර්ධන කටයුතු සම්බන්ධ ව්‍යාපෘතිය ආරම්භ කළද, අදහස් කල කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි.

3.4 ප්‍රමාදවූ ව්‍යාපෘති

--------------------

ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

----------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් අනුමත කරන ලද වැඩ සැලස්ම 11 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5 ආදායම් අභිමිවීම

--------------------

සභාවට අයත් පොළ කඩ කාමර 03 ක් බදු දී නොතිබුණි.

3.6 අපද්‍රව්‍ය කළමනාකරණ

--------------------------

අපද්‍රව්‍ය රැස්කර වර්ග කිරීම් නොකර ගොඩ ගසා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 5,000 සිට රු. 16,097,100 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

4.2 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රීය වත්කම්

------------------

මෝටර් වාහන 12 ක් අබලන් වී ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2016

-----------------------------------------

ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනයට නොගෙන තිබූ ලීටර් 1000 පමණ තාර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.